සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | නැටුම් (දේශිය) I පත්‍රය<br>நடனம் (சுதேச) வினாத்தாள்-1<br>Dancing (Oriental) Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

- අංක 01 සිට 30 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අදාල කොටස තෝරා ගත යුතුය.

01. සරඹ නැටීමේ දී පද පැගීමේ පුහුණුව මැන බැලීමට යොදනු ලබන උපක්‍රමය වන්නේ
    1. බෙර වාදනය කිරීම  2. ලයගුණ කිරීම
    3. සරඹ පද කටින් කීම  4. චලන දැක්වීම

02. අනාඝාතාත්මකව ගැයෙන පැදි විශේෂයකි.
    1. සංදේශ කවි  2. හටන් කවි
    3. පැල්කවි  4. ප්‍රශස්ති

03. දේශීය වාද්‍ය භාණ්ඩ අතර විතතාතත ගණයට අයත් භාණ්ඩයකි.
    1. ගැටබෙරය  2. දවුල
    3. තම්මැට්ටම  4. දඬු බෙරය

04. ' සොබමන් දෙව්වරු සඳෙනෙක් එතනට ' යන ගායනය
    1. සවරං කවියකි  2. තාලම් කවියකි
    3. චාමර කවියකි  4. මෝල් ගස් කවියකි

05. මේවා අනුපිළිවෙලින් කළ හා ලී කෙලිවලට සමානකම් දක්වන ද්‍රවිඩ ගැමි නැටුම වේ.
    1. කුම්මි හා සුලකු  2. චෙම්බු හා කුම්බි
    3. චෙම්බු හා කෝලාට්ටම්  4. කෝලාට්ටම් හා සුලකු

06. තාලම්පටින් නිකුත් වන ධ්වනි දෙක හඳුන්වන්නේ
    1. තත් , ජිත් යනුවෙනි  2. තිත් , තෙයි යනුවෙනි.
    3. තොං , තං යනුවෙනි  4. දොම් කිත යනුවෙනි.

07. බෙරයකින් වාදනය කළ හැකි බීජාක්ෂර ගණන
    1. එකකි  2. දෙකකි
    3. තුනකි  4. සතරකි

08. සිංහල මුද්‍රා නාට්‍ය ඉතිහාසයේ මංසලකුණ ලෙස සැලකෙනුයේ
    1. එස්. පණීභාරත මහතා ය  2. මුදියන්සේ දිසානායක මහතා ය
    3. චිත්‍රසේන මහතා ය  4. ප්‍රේමකුමාර එපිටවෙල මහතා ය

09. දේශීය නර්තන කලාවේ දියුණුවට අනුග්‍රහය දක් වූ රජවරු ලෙස නම්කළ හැක්කේ

1. ඇහැලේපොල සහ වළගම්බා රජවරුන් ය.
2. මහා පරාක්‍රමබාහු සහ ධාතුසේන රජවරුන් ය.
3. ඇහැලේපොල සහ කාවන්තිස්ස රජවරුන් ය.
4. මහා පරාක්‍රමබාහු සහ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජවරුන්ය

10. නැටුමට අධිපති දෙවිදුන් ලෙස හඳුන්වන්නේ

1. කොහොඹා දෙවියන්
2. කතරගම දෙවියන්
3. ශිව දෙවියන්
4. සමන් දෙවියන්

- ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුරු තෝරන්න.

11. වන්නමක් / සින්දු වන්නමක් නර්තනය කිරීමේ දී ........................................ නැටීම සම්ප්‍රදායික ලක්ෂණයකි.

1. සරඹ පද
2. තාලානුකූල පද
3. රිද්මයානුකූල චලන
4. ප්‍රකාශනාත්මක චලන

12. උඩරට / පහතරට නර්තන සම්ප්‍රදායන්හි පද කිහිපයක් නටා අවසාන කරනු ලබන දීර්ඝ පද කොටස් .................................... වශයෙන් හඳුන්වනු ලැබේ.

1. කණ්ඩිලම , ඉරට්ටිය
2. කස්තිරම , අන්තාඩිය
3. කස්තිරම , ඉරට්ටිය
4. කස්තිරම , කලාසම

13. පහතරට මඩු ශාන්ති කර්මවලදී ප්‍රධාන ඇදුරා ........................................ නමින් හැඳින්වේ.

1. කට්ටඩියා
2. පත්තිනි හාමි
3. යක්දෙස්සා
4. කොට්ටෝරුවා

14. ශ්‍රී ලංකාවේ පවතින ........................................ ගැමි නාටක වශයෙන් සලකේ.

1. නෘත්‍ය , සොකරි කවි , නාඩගම්
2. නූර්ති , කෝලම් , රූකඩ
3. සොකරි , කෝලම් , නාඩගම්
4. කෝලම් , කෝට්ටම් , නාඩගම්

15. ප්‍රස්තාරකරණයේ දී අවග්‍රහය දක්වන සංකේතය මේ නමින් හැඳින්වේ.

1. ශබ්ද යතිය
2. නිශ්ශබ්ද යතිය
3. ග්‍රහ
4. ආවර්ත

16. සම්භාව්‍ය කලා කෘති නරඹා රස විඳීමෙන් .................................................................. වර්ධනය වේ.

1. නිර්මාණාත්මක බව හා නර්තන කුසලතා
2. චිත්තවේග පාලනය හා පෞරුෂ
3. විවේකය අර්ථවත්ව ගත කිරීම හා සන්නිවේදන කුසලතාවය
4. නිර්මාණාත්මක හා විචාරාත්මක චින්තනය

17. සන්නිවේදන කාර්යයේ දී දවුල සුදු පිරුවටයකින් වසා වාදනය කිරීම ........................................ වේ.

1. වද බෙර
2. පිං බෙර
3. අත්‍යාබෙර
4. මළ බෙර

18. කරදිය මුද්‍රා නාට්‍යයේ විචිත්‍රවත් ලෙස රංගවස්ත්‍රාභරණ සහ වේදිකා පසුතල .................................... ශිල්පියා විසින් නිර්මාණය කරන ලදි.

1. රවිබන්දු විද්‍යාපති
2. සෝමබන්දු විද්‍යාපති
3. ශේෂා පළිහක්කාර
4. පියසාර ශිල්පාධිපති

19. ශ්‍රී ලංකාවේ නර්තන ඉතිහාසය හා සම්බන්ධ ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් .................................. සැලකේ.

1. ලෙන්ලිපි සහ මහා කාව්‍ය
2. වංශ කථා සහ සන්දේශ කාව්‍ය
3. දේශාටන වාර්තා සහ ජනප්‍රවාද
4. ඉතිහාස ග්‍රන්ථ සහ ජනකවි

20. නර්තනයේදී භාවිතා වන ............................................ ත්‍රිවිධ ලය ලෙස නම් කෙරේ.

1. විලම්භ , මධ්‍ය , ධ්‍රැත
2. මධ්‍ය , ධ්‍රැත , විලම්භ
3. ධ්‍රැත , මධ්‍ය , විලම්භ
4. විලම්භ , ධ්‍රැත , මධ්‍ය

- 21 සිට 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත වගුව උපයෝගි කර ගන්න.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | ගැටබෙරය | පහතරට බෙරය | දවුල | තම්මැට්ටම |
| B | පන්තේරුව | සිම්බල් | තලිය | තාලම්පට |
| C | හොරණෑව | කොම්බුව | හක්ගෙඩිය | බටනලාව |
| D | උඩැක්කිය | බුම්මැඩිය | රබාන | දඬුබෙරය |

21. අණබෙර වාදනය සඳහා යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩය දැක්වෙන්නේ

1. A පේළියේ අංක 2 යටතේ ය
2. A පේළියේ අංක 4 යටතේ ය
3. A පේළියේ අංක 3 යටතේ ය
4. A පේළියේ අංක 1 යටතේ ය

22. ගැමි නැටුම් සඳහා යොදා ගත හැකි භාණ්ඩ දැක්වෙන්නේ

1. A පේළියේ ය
2. B පේළියේ ය
3. C පේළියේ ය
4. D පේළියේ ය

23. සාම්ප්‍රදායික නර්තනය සඳහා භාවිතා කෙරෙන භාණ්ඩ දැක්වෙන්නේ

1. A පේළියේ ය
2. B පේළියේ ය
3. C පේළියේ ය
4. D පේළියේ ය

24. හේවිසි වාදනය සඳහා යොදා ගනු ලබන වාද්‍ය භාණ්ඩ සඳහන්ව ඇත්තේ

1. C පේළියේ 1 තීරුවේ සහ A පේළියේ 3 හා 4 තීරුවලය.
2. D පේළියේ 1 තීරුවේ සහ B පේළියේ 1 හා 4 තීරුවලය.
3. C පේළියේ 1 තීරුවේ සහ A පේළියේ 1 හා 2 තීරුවලය.
4. D පේළියේ 1 තීරුවේ සහ C පේළියේ 1 හා 3 තීරුවලය.

25. 'හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්' යන ගීතය අඩංගු වේදිකා නාට්‍ය වනුයේ

1. විදුර නාට්‍ය 2. බෙරහඬ නාට්‍ය

3. විකෘති නාට්‍ය 4. කැලණි පාලම නාට්‍ය

26. මේවා දේශීය ගැමි නැටුම් සඳහා භාවිත කරන උපකරණ වේ

1. කළ , රබන් , උඩැක්කි 2. කළ , ලී , පතුරු

2. දැකැති , මෝල්ගස් , පන්තේරු 4. වේවැල් , කඩු , පන්දු

27. සොකරි නාටකයේ එන වෙදරාළගේ චරිතයෙන් උපදින රසය වනුයේ

1. භීබත්ස්‍ය රසය 2. ශාන්ති රසය

3. හාස්‍ය රසය 4. භයානක රසය

28. ආශිර්වාදය හා දෙවියන්ට ඇරයුම් කිරීම සඳහා කෙරෙන වාදනයකි.

1. හේවිසි වාදනය 2. අත්‍යා බෙර වාදනය

3. මඟුල් බෙර වාදනය 4. අභින පද වාදනය

29. කොහොඹා කංකාරිය හා සම්බන්ධ චාරිත්‍ර අතර මුල්ම අස්වැන්න කොටස මේ නමින් හැඳින්වේ.

1. අක්යාල 2. මුරුතැන්

3. පේබත් 4. අලුත් සහල්

30. පහන්මඩු ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලියකි.

1. පත්තිනි නැටීම 2. දේවකෝල් පාඩුව

3. අසුර යක්කම 4. මුදුන් තාලය

e-thaksalawa The National e-learning Portal for The General Education

11 කොටස

උඩරට නර්තනය

31 ' ධොං ජිංත ගත දොංත ' මෙම බෙර පදය අයත් වන්නේ

1. මාත්‍රා 2 + 4 තාලයටය 2. මාත්‍රා 2 + 3 තාලයටය

3. මාත්‍රා 3 + 4 තාලයටය 4. මාත්‍රා 3 + 3 තාලයටය

32. ' තක්කඩ කඩතක ජිජිකුද 'යනුවෙන් ආරම්භවන කස්තිරම අයත් වන්නේ

1. 12 වන ගොඩ සරඹයටය 2. 7 වන ගොඩ සරඹයටය

3. 9 වන ගොඩ සරඹයටය 4. 11 වන ගොඩ සරඹයටය

33. 'එම වන් පලුවකින් - එවුපන් සැනයකින් ' මෙම කවි පදය අයත් වන්නේ

1. තුරගා වන්නමටය 2. සැවුලා වන්නමටය

3. සිංහරාජ වන්නමටය 4. නෛයඩි වන්නමටය

34. සාම්ප්‍රදායික උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ

1. සත් කෝරළය , සතර කෝරළය සහ මහනුවර වේ.

2. සත් කෝරළය , සතර කෝරළය , මාතර වේ.

3. සත් කෝරළය , තුන් කෝරළය , හොරණ වේ.

4. සත් කෝරළය , හල්පිට කෝරළය , කළුතර වේ.

35. උඩරට වන්නමක ව්‍යුහය

1. කොටස් 6 කින් සමන්විතය
2. කොටස් 8 කින් සමන්විතය
3. කොටස් 4 කින් සමන්විතය
4. කොටස් 5 කින් සමන්විතය

36. සිංහරාජ වන්නමට අයත් අඩව්වක කොටසකි.

1. කිටි තකට කුන්දත් ජිකරොං
2. ජෙං - තත්තත් ජෙං තත්තත්
3. තත්ත තරි තරි තතරි තරි තරි
4. තාන් දොමිති ගත දොමිකිට

37. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දක්නට හැකි නර්තන අංග දෙකකි.

1. පලවැල දානය , වඩිග පටුන
2. අස්නේ , ආවැන්දුම
3. කෝල්පාඩුව, මාරාව
4. හත්පදය , ගරා යකුන් නැටීම

38. කුවේණියකගේ ශාපයෙන් රෝගාතුර වූයේ

1. මලය රජුය
2. විජය රජුය
3. ගජබා රජුය
4. පඬුවස් දෙව් රජුය

39. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

1. ඇස්. පණිභාරත මහතා
2. කේ.එස්. ප්‍රනාන්දු මහතා
3. ගෝමිස් ගුරුන්නාන්සේ
4. ප්‍රේමකුමාර එපිටවෙල මහතා

40. බෙර වාදනය දැනට හුරුකර ගැනීමේ දී පළමු බෙර සරඹය ලෙස ගැටබෙරයෙන් වාදනය කරනු ලබන්නේ

1. තකට කුදට
2. තකට
3. තත් ජිත්
4. කුදට

e-thaksalawa The National e-learning Portal for The General Education

## 11 කොටස
## පහතරට නර්තනය

31. 'ගුං දෙගත ගත්ත ගුං ' මෙම බෙර පදය අයත් වන්නේ

1. මාත්‍රා 2 + 4 තාලයටය
2. මාත්‍රා 2 + 3
3. මාත්‍රා 3 + 4 තාලයටය
4. මාත්‍රා 3 + 3

32. 'රිම් ගත ගුද ගත් තම්, රිම් ගත ගුද ගත්තම් ' යනුවෙන් ආරම්භ වන ඉරට්ටිය අයත් වන්නේ

1. 12 වන ඉළංගම් සරඹයටය
2. 9 වන ඉළංගම් සරඹයටය
3. 7 වන ඉළංගම් සරඹයටය
4. 11 වන ඉළංගම් සරඹයටය

33. 'සඳ සන්දර දිගු පුන්ගිර දිළිමන් ඔබ යස වා ' මෙම කවිය අයත් වන්නේ

1. අනුරාග දණ්ඩ තාලය සින්දු වන්නමටය
2. නාතිලංචි තාලය සින්දු වන්නමටය
3. නළු ගීතිකා තාලේ සින්දු වන්නමටය
4. ශුද්ධ තාලේ සින්දු වන්නමටය

34. සාම්ප්‍රදායික පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ

1. රයිගම , මාතර සහ බෙන්තර වේ.
2. රයිගම , හොරණ සහ බදුල්ල වේ.
3. මාතර , බෙන්තර සහ රත්නපුර වේ.
4. මාතර , බෙන්තර සහ ඇහැළියගොඩ වේ.

35. පහතරට වන්නමක ව්‍යුහය

1. කොටස් 4 කින් සමන්විතය. 2. කොටස් 6 කින් සමන්විතය.

3. කොටස් 2 කින් සමන්විතය. 4. කොටස් 5 කින් සමන්විතය.

36. අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමට අයත් ඉරට්ටියක කොටසකි.

1. ගුංදත් ගුගිති ගදිරිකිට ගත ගත 2. රෙගතත් දෙගතත් රෙගතත් දොම් දොම්

3. ගුදිත ගදිත ගත ගත් දෑහිං ගුං දෑහිං 4. තක දිත් තක දොං කිත් තත් කිටිකත

37. දෙවොල් මඩු යාගයේ දී දක්නට ලැබෙන නර්තන අංග වේ.

1. හත්අඩිය , අඹ විදමන 2. තෙල්මේ , වාහළ නැටීම

3. මරා ඉපැද්දීම , වඩිග පටුන 4. තොරන්යාගය , සමයම් පද

38. දෙවොල් මඩු පුරාවෘත්තයට අනුව හිසරදයකින් පෙළුණු බව කියවෙන රජු වන්නේ

1. පඬි රජුය. 2. පඬුවස් දෙව් රජුය

3. මලය රජුය 4. සේරමාන් රජුය

39. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

1. කේ.එස්. ප්‍රනාන්දු මහතා 2. ගලුකාගම හීන් නිලමේ

3. ජේ.ඊ. සේදරමන් මහතා 4. සන්දෝරිස් ජයන්ත මහතා

40. බෙර වාදනය දැතට හුරුකර ගැනීමේ දී පළමු බෙර සරඹය ලෙස පහතරට බෙරයෙන් වාදනය කරනු ලබන්නේ

1. ගගිති 2. ගුගිති

3. දිරිකිට 4. ගුග්ගුඳ

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | නැටුම් (දේශීය) II පත්‍රය<br>நடனம் (சுதேச) வினாத்தாள்-1<br>Dancing (Oriental) Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

1. සොකරි නාටකයේ රඟ මඩල ........................................................ යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. වැටකේ පඳුරක් , ගල්කුලක් , පැල්පතක් පසුතල ලෙස යොදා ගන්නා ලද කලා කෘතියකි................
3. 1 2 / 1 2 / 1 2 3 4 මෙම තාල රූපය ............................................ නමින් හැඳින්වේ.
4. ග්‍රහපත්ති කවි ගායනයේ දී තාල තබා ගන්නා වාද්‍ය භාණ්ඩය ......................... වේ.
5. ' තිදෙනා බැගින් අතිනතගෙන කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනන් ' පිළිබඳව සඳහන් කරන ලද දේශ සංචාරකයා කවුද ? ..............................................
6. පහතරට බෙරයෙහි බෙර ඇස සඳහා යොදා ගනු ලබන්නේ ............................................ සම්ය.
7. ' රටකට මව් සමඟින් ' මෙම ගායනය ............................................ ගණයට අයත් වේ.
8. කුඹී කථාව මුද්‍රා නාට්‍යයෙහි නිර්මාණකරු ලෙස ........................................ නම් කළ හැකිය.
9. ළමුන්ගේ මානසික ස්වස්ථාව කෙරෙහි බලපාන පරිසර සාධක කොටස් 2 කි.
   1. ........................................................ 2. ........................................................
10. අංග රචනය කිරීමෙන් නළුවාට ඇති ප්‍රයෝජන 2 ක් ලියන්න.
   1. ........................................................ 2. ........................................................

02.
1. මාත්‍රා 2 + 3 දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
2. මාත්‍රා 2 + 4 දෙතිතට අයත් වන්නමක / සින්දු වන්නමක කවියක් ප්‍රස්තාර කරන්න.
3. මාත්‍රා 4 + 4 තනිතිතට අයත් කස්තිරම / ඉරට්ටිය ලියන්න.

03. කොහොඹා කංකාරිය , දෙවොල් මඩුව සහ පහන් මඩුව ප්‍රධාන දේශීය ශාන්තිකර්ම ලෙස හැඳින්වේ.

1. ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න.
2. පූර්ව චාරිත්‍ර 04 ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.
3. ශාන්ති කර්මයන්හි අන්තර්ගත සාරධර්ම පිළිබඳ විස්තර කරන්න.

04. **ජන ගී සහ ජන නැටුම් ජීවිතය විදහා දක්වන කලාංග වේ.**

1. ජීවන වෘත්තීන් හා බැඳුණු ගැමි නැටුම් 04 ක් නම් කරන්න.
2. ඔංචිලි වාරම් හා රබන් කවිවල පසුබිම පිළිබඳ හැඳින්වීමක් කරන්න.
3. ජීවන වෘත්තීන් හා බැඳුණු ගැමි නැටුමක් නිර්මාණය කිරීමේ දී චලන ක්‍රියාකාරකම් පෙළ ගැස්වූ ආකාරය පැහැදිලි කරන්න.

05. **දේශීය ජන නාටක අතර සොකරි නාටකය විශේෂ තැනක් ගනී.**

1. සොකරි නාටකයට අයත් කවියක් ලියන්න.
2. ඉහත ජන නාටකයට අයත් චරිත දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.
3. සොකරි නාටකයෙන් පිළිබිඹු වන සමාජ විවරණය පැහැදිලි කරන්න.

06. **සන්නිවේදන කාර්යය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගනී.**

1. අතීතයේ දේශීය වාද්‍ය භාණ්ඩ උපයෝගි කරගනිමින් කළ ආගමික සහ සමාජීය උත්සව 04 ක් නම් කරන්න.
2. සන්නිවේදනය සඳහා භාවිතා කරනු ලබන දේශීය වාද්‍ය භාණ්ඩ 04 ක් නම් කරන්න.
3. විවිධ මනෝභාවයන් මතුකිරීම සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගත් අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

07. **නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථාව සාර්ථක දිවි පෙවතක් ගත කිරීමට ඉවහල් වේ.**

1. මානසික ස්වස්ථාව සඳහා ඉවහල්වන නිර්ණායක 3 ත් සඳහන් කරන්න.
2. නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන සමාජමය හැකියා 3 ක් නම් කරන්න.
3. ඔබ ලබාගත් අත්දැකීම් ඇසුරෙන් උක්ත තේමා පාඨයට අදාලව කරුණු දක්වන්න.

The National e-Learning Portal for The General Education